බුද්ධිමය දේපල අරමුදල - 2023
------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධිමය දේපල අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.6,359,198 ක් වූ කාර්යාල සවිකිරීම් හා පොත් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා කටයුතු යොදා ඇති අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මෙම තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| බුද්ධිමය දේපල විෂයට අදාළ පොතක් සිංහල භාෂාවට පරිවර්තනය කර ඉන් පොත් 3000 ක් මුද්‍රණය කර ගැනීමට මුද්‍රණ හා පරිවර්තන වියදම් රු.1,628,423 ක මුදලක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙන් ලැබී තිබුණි. එම ලැබීම, අරමුදලේ ආදායමක් හෝ වියදමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලෝක බුද්ධිමය දේපල දිනය වෙනුවෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා වූ පොතක් මුද්‍රණය සඳහා වියදම් පියවීමට ලබා දී ඇති අතර, එය පොදු තැන්පත් ගිණුම භාවිතා කරමින් එම කාර්යය සිදු කළ බව. | සියළු ලැබීම් හා වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 සහ 2022 දෙසැම්බර් 20 දිනැති අංක 01/2020 (ii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | සේවා සම්පාදනය සඳහා අයකරන ගාස්තු ඉහළ නංවා නොමැති සියලුම රාජ්‍ය ආයතන ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කල යුතු වුවද, කාර්යාලය විසින් ගාස්තු සංශෝධනය කර ගැසට් කර නොතිබුණි. | ගාස්තු සංශෝධනයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය හා ගැසට් නිවේදනය 2023 අප්‍රේල් 12 දින වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යංශය වෙත යොමුකර ඇතත් ගාස්තු සංශෝධනය සඳහා අනුමැතිය ලැබී නොමැති බව . | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.308,424,933 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 174,567,112 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.133,857,821 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන පොලී ආදායම රු. 137,902,566 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ඉඩමේ අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා දරන ලද රු.මිලියන 22.29 ක වියදම ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණ ද, එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය අත්පත් කර ගෙන තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කළ මුදල සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අදාලව, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වෙතින් ලේඛණ කැඳවා ලිපියක් යොමු කර ඇතත් ප්‍රගතියක් නොමැති බැවින් එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අදාලව වර්තමාන තත්ත්වය විමසා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කර ඇති බව. | භූමියක අයිතිය පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම නොකළයුතු අතර, නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් එම මුදල ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි කර තිබූ වෙළඳ ලකුණු අයදුම්පත් 3762 කින් අයදුම්පත් 892 ක් 1995 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ඉදිරිපත් කර තිබූ ඒවා විය. මේ සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේදී පහත කරුණුද නිරීක්ෂණය විය. | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි කළ වෙළඳ ලකුණු අයදුම්පත් 27 ක් සම්බන්ධයෙන් සිදුකළ නියදි පරීක්ෂාවේදී, ලියාපදිංචිය සඳහා වර්ෂ 2 සිට වර්ෂ 28 දක්වා කාලයක් ගෙන තිබුණි. ලියාපදිංචි කළ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය අනුව ලියාපදිංචි කිරීමේ එක් එක් පියවරයන්හිදී නිර්දේශිත කාලය දක්වා තිබූ අතර, සතියක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 8ක සිට මාස 221 ක් ද, මාසයක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 8ක සිට මාස 94 ක් ද, මාස දෙකක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 24 ක සිට මාස 192 ක් ද, මාස තුනක කාලයකින් නිම කළ යුතු කාර්යයක් සඳහා මාස 10 ක සිට මාස 96 ක් අතර ද කාල පරාසයක් ගෙන තිබුණි. | දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර වූ හේතූන් මත එක් රැස් වූ රාජකාරීන් සිදු කරමින් අවම කාර්ය මණ්ඩලයකින් යුතු ව රාජකාරී කටයුතු කර ගෙන යන අවස්ථාවක ද්විතික පරීක්ෂා සිදු කර පරීක්ෂණ තීරණය අයදුම්කරු වෙත දැන්වීම පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියෙහි සඳහන් කාලසීමාව තුළ ඉටු කළ නොහැකි කාර්යයක් බව. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ එක් එක් පියවරයන්හි ප්‍රමාදයට බලපාන හේතු සොයා බලා විසඳුම් ලබා දිය යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතික්ෂේපිත වෙළඳ ලකුණු අයදුම්පත් 1,923 කින් වර්ෂ එකකට අඩු කාලයකදී අයදුම්පත් 62 ක් පමණක් ප්‍රතික්ෂේප කර තිබූ අතර අයදුම්පත් 37 ක් ප්‍රතික්ෂේප කරන දින වන විටත් වර්ෂ 5ක් ද, අයදුම්පත් 104 ක් සඳහා වර්ෂ 3 ක සිට වර්ෂ 4 ක් ද, අයදුම්පත් 1,720 ක් සඳහා වර්ෂ 01 ක සිට වර්ෂ 02 ක අතර කාලයක් ද, ඉක්මවා තිබුණි. | රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය, හා ආර්ථික අර්බුධකාරී තත්ත්වය යම් ප්‍රමාදයක් ඇති වීමට හේතු වූ බවත් සෑම මසකම අයදුම්පත් 1000ට ආසන්න ප්‍රමාණයක් ගොනුවීම හේතුවෙන් එක්රැස් වූ රාජකාරි අවම කර ගැනීම දුෂ්කර වූ බව. | වෙළඳ ලකුණු සඳහා ප්‍රාථමික හා ද්විතීයික පරීක්ෂාව සිදු කර ප්‍රතික්ෂේප කිරීමේ හෝ පිළිගැනීමේ ලිපි නිකුත් කිරීමට ගත වන කාලය අවම කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 111(9) (අ) වගන්තිය හා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රකාරව අයදුම් පත්‍රය ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වූ ගාස්තු නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත් සති 04 ක කාලයක් තුළ එය සිදු කළ යුතු වුවද , 2023 දෙසැම්බර් 31 දින වන විට ගාස්තු ගෙවා ඇති නමුත් ගැසට් නොකළ අයදුම්පත්‍ර සංඛ්‍යාව 690 ක් විය. මෙම අයදුම්පත්‍ර 83 ක නියැදියක් IPAS පද්ධතියෙන් පරීක්ෂා කිරීමේදී ඉන් අයදුම්පත් 35 ක් 2024 ජනවාරි 11 දිනය වන විටත් ගැසට් පත්‍රයේ පළ කර නොතිබූ අතර, එහි ප්‍රමාදය වර්ෂ 01 ක සිට වර්ෂ 13 ක් දක්වා වී තිබුණි. | එක්රැස් වූ විශාල රාජකාරීන් ප්‍රමාණයක් හා ඉතා සීමිත කාර්යමණ්ඩලයකින් රාජකාරී කටයුතු ඉටුකරන බැවින් පුරවැසි/සේවා ප්‍රඥප්තියේ සඳහන් වන කාල සීමාව තුළ වෙළඳ ලකුණු ලියාපදිංචිය දක්වා වූ එක් එක් කාර්යයන් ඉටු කිරීම ප්‍රායෝගික නොවන කරුණක් බව. | අදාළ ගාස්තු නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත් ප්‍රඥප්තිය ප්‍රකාරව සති 04 ක කාලයක් තුළ ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | 2023 දෙසැම්බර් 31 වන විටත් 2021 ,2022 හා 2023 වර්ෂවල ලද අයදුම්පත්වලින් අයදුම්පත් 12,898 ක වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | වෙළඳ ලකුණු ශාඛාවේ නිලධාරී සංඛ්‍යාව වැඩි කිරීම හැර විසඳුමක් නොමැති බව අමාත්‍යාංශ කළමනාකරණ රැස්වීම්වල දී ලිඛිතව හා වාචිකව දැනුම් දී ඇති බව | අයදුම්පත් ලද පසු පනත ප්‍රකාරව ලියාපදිංචි කටයුතු ආරම්භ කළ යුතු ය. |
| (v) | 2016 වර්ෂයේ අයවැය යෝජනාව අනුව වෙළඳ හා සේවා ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා වූ මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර 2018 වර්ෂය වන විට රු.මිලියන 78 ක වියදමක් විසර්ජන පනත මඟින් දරා තිබුණි. එසේ වුවද 2023 වර්ෂය අවසන් වන විටත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීමේ කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබූ බැවින් වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ නොහැකිව තිබුණි. | Madrid ප්‍රොටෝකෝලය සංකීර්ණ නෛතික හා තාක්ෂණික කරුණු ඇතුලත් අන්තර්ජාතික ගිවිසුමකි. එයට විවිධ පාර්ශවයන්ගේ අදහස් හා අභිලාශයන් නියෝජනය වන හා ඉටුවන අයුරින් බුද්ධිමය දේපල පනත සංශෝධනය කිරීමට නීතිපති වෙත යොමු කිරීමට නියමිත බව. | මැඩ්රිඩ් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේ පේටන්ට් අයදුම්පත්‍ර 416 ගොනු කර තිබූ අතර , අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වර්ෂ 5 ක සිට අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී නිකුත් කළ පේටන්ට් බලපත්‍ර 200 න් 59 ක් 2010 වර්ෂයේ සිට 2022 | රට තුල උද්ගත වූ ආර්ථික පසුබෑම පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව අඩු වීම කෙරෙහි බලපෑ හැකි බවත් ගොනු කරනු ලබන බොහෝ අයදුම්පත් දෝෂ සහිත වීම, දෝෂ පිළිබඳ ව දැනුම් දුන්න ද අදාල නිවැරදි කිරීම් ප්‍රමාද වීම, නැවත ලබා | ප්‍රමාදයට බලපාන හේතු සඳහා විසඳුම් ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය දක්වා වූ දේශීය අයදුම්පත් වලට අදාළව නිකුත් කළ බලපත්‍ර විය. | දෙන වාර්තාද දෝෂ සහිත වීම හා සංකීර්ණ විෂය කරුණු සහිත ගොනු වීමත් ඊට හේතු වී ඇති බව. | |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ මුළු ආදායම රු.375,117,275 ක් වූ අතර ඉන් සියයට 79.84 ක් ආයෝජන පොළීයෙන් ද, සියයට 20.16 ක් බුද්ධිමය දේපළ පනත යටතේ අයකරන ගාස්තු වලින්ද සමන්විත වී තිබුණි. ඒ අනුව බුද්ධිමය දේපළ පනත යටතේ වන ගාස්තුවලින් ජනිත වන ආදායම මුළු ආදායමෙන් අඩු ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. | ආයෝජන ආදායම බුද්ධිමය දේපල පනත යටතේ සේවා සපයා එකතු කරන ආදායම හා සම්බන්ධතාවයක් නොමැති බව | අරමුදලේ මෙහෙයුම් ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |